# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1994/77 - 2016 නොවැම්බර් 25 වැනි සිකුරාදා - 2016.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස – පළාත් සභා

### පළාත් සභා දැනුම්දීම් - උතුරු පළාතේ, පළාත් සභාව

**2016 වර්ෂයේ අංක 04 දරන උතුරු පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය**

උතුරු පළාත් පළාත් සභාව විසින් 2016 වර්ෂයේ සැප්තැම්බර් මස 22 වෙනි දින සම්මත කරන ලද 2016 වර්ෂයේ අංක 04 දරන උතුරු පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2016 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලබේ.

ක. තෙයිවේන්ත්‍රිම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2016 නොවැම්බර් මස 22 වැනි දින,
ඒ9 මාර්ගය,
කයිතඩි,
සභා ලේකම් කාර්යාලයේ දී ය.

## උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥාප්තිය

*විධි විධාන පෙළගැස්ම*

1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

I වැනි කොටස

**ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම**

2. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කළ යුතු බව.
3. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් කළමනාකරණය හා පරිපාලනය
4. ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්
5. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට තාවකාලික අනුමතය සඳහා ඉල්ලුම් කිරීම.
6. තාවකාලික අනුමතය ප්‍රදානය කිරීම.
7. අනුමත කරන ලද කාලසීමාව තුළ දී ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම සම්පූර්ණ කිරීම.
8. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම.
9. ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු.
10. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා ළමුන් ඇතුළත් කිරීම සඳහා කළමනාකරුගේ වගකීම.
11. ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම.
12. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් විසින් පවත්වාගත යුතු අවම ප්‍රමිති.

II වැනි කොටස

**පරීක්ෂකවරු සහ අමුත්තන්**

13. පරීක්ෂකවරු පත් කිරීම.
14. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය.
15. විශේෂ නිරීක්ෂකයන් සඳහා කාලය වෙන්කරවා ගැනීම.

III වැනි කොටස

**ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්**
**වසා දැමීම, අත්හිටුවීම හෝ ලියාපදිංචි සහතිකය අවලංගු කිරීම**

16. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වසා දැමීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.
17. ලියාපදිංචි සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම.
18. පළාත් කොමසාරිස්වරයා විසින් කරනු ලබන සාමාන්‍ය හා විශේෂ විධාන.
19. අවලංගු කිරීමේ නියෝග.
20. අභියාචනා කිරීමට ඇති අයිතිය.
21. අභියාචනාව මත ක්‍රියාත්මක කළ යුතු නියෝග.
22. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සිට ළමුන් මාරු කර යැවීම.
23. ලියාපදිංචි සහතිකයක් අවලංගු කිරීමේ බලපෑම.

IV වැනි කොටස

**උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය**

24. උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය.
25. උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පාලකයාගේ කාර්ය.

V වැනි කොටස

**භාර ගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන**

26. වයස අවුරුදු පහට අඩු ළමුන් බලා ගැනීම.
27. උපතක් ලියාපදිංචි කිරීම.
28. පරීක්ෂා කිරීමේ චර්යා ඉදිරිපත් කිරීම.

VI වැනි කොටස

## මුදල්

29. ළමයකු ස්ථානගත කිරීම.
30. අරමුදල් සැපයීම.
31. ගිණුම් පරීක්ෂා කිරීම.

VII වැනි කොටස

## වැරදි

32. ප්‍රඥප්තියට පටහැනිව ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම වරදක් බව.
33. තොරතුරු ලබා දීමට අපොහොසත් වීම හෝ අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම වරදක් බව.
34. පළාත් කොමසාරිස්වරයාට බාධා කිරීම වැනි දේ වරදක් බව.
35. පොදු දඬුවම්.
36. පුද්ගල මණ්ඩලයක් මගින් සිදු කරනු ලබන වැරදි.
37. කළමනාකරුවකු විසින් වරදක් සිදුකරන විට අතිරේක දඬුවම් පැමිණවීම.

VIII වැනි කොටස

## විවිධ

38. පළාත් කොමසාරිස්වරයා විසින් සහනාධාර ලබාදීම.
39. නියෝග.
40. පළාත් කොමසාරිස්වරයාට වාර්තා ඉදිරිපත් කිරීම.
41. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාර්ෂික මූල්‍ය වාර්තාව.
42. ළමා නිවාස ලියාපදිංචි කිරීම.
43. අර්ථ නිරූපණ.
44. ඉතිරි කිරීම.
45. අනුකූලතාවයක් ඇති වූ විට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචිය, අධීක්ෂණය සහ පරිපාලනය සඳහා විධිවිධාන සැලසීම, එවැනි ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඊට සම්බන්ධ සහ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම.

මෙම ප්‍රඥප්තිය අනත්දරු නිවාස ආඥාපනතේ (142 වන අධිකාරය) විධිවිධාන සමග අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:

ලුහුඬු නාමයත්, ක්‍රියාත්මක වන දිනයත්,

1. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ 2016 අංක 04 දරන උතුරු පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, උතුරු පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වේ.

## I වන කොටස

## ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කළ යුතු බව.

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හා ඉන් පසුව අවුරුදු පහේ සිට දහඅට දක්වා වූ වයස්වල අනාථ හෝ අත්හල දරුවන් (මෙහි මින්මතු "ළමුන්" ලෙස හැඳින්වෙන) සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සලසා ඇති කාර්ය සඳහා ලියාපදිංචිය ලබා ගැනීමක දී හැර, උතුරු පළාත තුළ පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන කළමනාකරණය හා පවත්වාගෙන යාම

3. (1) ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ පරිපාලනය සහතික කිරීමේ වගකීම පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා (මෙහි මින්මතු "පළාත් කොමසාරිස්වරයා" යනුවෙන් හැඳින්වෙන) වෙත පැවරෙනු ඇත.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් කොමසාරිස්වරයා වෙත පැවරෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම පළාත් කොමසාරිස්වරයා විසින් සිදු කරනු ඇත.

(3) පළාත් කොමසාරිස්වරයා විසින්, ඔහුට හැඟෙන පරිදි යම් කොන්දේසිවලට යටත්ව නිලධරයකු වෙත තමා සතු බලතල, කාර්ය හා කර්තව්‍ය පවරනු ලැබිය හැකි අතර, එකී නිලධරයා විසින් ඔහු වෙත එලෙස පවරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) පළාත් කොමසාරිස් විසින්, ඔහු යෝග්‍ය යැයි අදහස් කරන්නේ නම්, නිලධරයකුට පවරන ලද බලතල, කාර්යයක් හෝ කර්තව්‍යයක් කිරීම, ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම කළ හැක.

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්.

4. මෙම ප්‍රඥප්තිය යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ:-

*(අ)* ඉල්ලුම්කරු, 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය සහ අධීක්ෂණය) පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කළ ස්වෙච්ඡා සංවිධානයක් හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ඇති කිරීම, පිහිටුවීම සහ පවත්වාගෙන යාම අරමුණක් වන උතුරු පළාතේ පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් හෝ විය යුතු ය ;

*(ආ)* ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට සහ පවත්වාගෙන යාමට ඉල්ලුම්කරුට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් තිබිය යුතු ය ;

*(ඇ)* ඉල්ලුම්කරු විසින් -

(I) සභාපති, උපසභාපතිවරයෙක්, ලේකම්වරයෙක්, නියෝජ්‍ය ලේකම්වරයෙක්, භාණ්ඩාගාරික සහ කළමනාකරුවෙක් ඇතුළු සාමාජිකයන් හත් දෙනෙකුගෙන් යුත් යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලනය සඳහා පිරිමි හා ගැහැණු අංශ සඳහා වෙන් වූ කළමනාකාර මණ්ඩලයක් යෝජනා කර තිබිය යුතු ය ;

(II) යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ කළමනාකරු ශ්‍රී ලංකා පුරවැසියන් වන බව සහ අවම වශයෙන් අඛණ්ඩව වසර තුනක කාලයක් උතුරු පළාත් සීමා තුළ නේවාසිකයන්ව සිටින බවත් සහතික කළ යුතු ය ;

(III) කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන අවස්ථානුකූලව දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් බව සහතික විය යුතු ය,

*(ඈ)* යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා චංචල හා නිශ්චල දේපළ ඉල්ලුම්කරු සතු විය යුතු ය ;

*(ඉ)* යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට නියමිත ස්ථානය ආරක්ෂාකාරී පරිසරයක පිහිටා ඇති බව ඉල්ලුම්කරු සහතික විය යුතු ය.

*(ඊ)* යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට නියමිත ඉඩම ස්වෙච්ඡා සංවිධානයේ හෝ සංස්ථාපිත ආයතනයේ නමින් පැවතීම හෝ අවම වශයෙන් අවුරුදු විසිපහක කාලයක් සඳහා බද්දට ගනු ලැබ තිබීම ;

*(උ)* 9 වන වගන්තියේ සඳහන් ප්‍රතික්ෂේප කළ හැකි කවර හෝ හේතුවක් යටතට සාමාජිකයන් අයත් නොවිය යුතු ය ;

*(ඌ)* ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ දක්වා ඇති අවම සුදුසුකම් ඉල්ලුම්කරු විසින් සපුරාලිය යුතු ය.

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා තාවකාලික අනුමතය.

5. (1) උතුරු පළාත තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපේක්ෂා කරන ස්වෙච්ඡා සංවිධානයක් හෝ සංස්ථාපිත ආයතනයක්, මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සපුරන විට දී, මෙම ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් එම යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට තාවකාලික අනුමතයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු අතර, එම ඉල්ලීම එම යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු වශයෙන් කටයුතු කිරීමට පත් කර ඇති තැනැත්තා විසින් අත්සන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තාවකාලික අනුමතය සඳහා කරන ලද ඉල්ලීමක් ලද විට දී, පළාත් කොමසාරිස්වරයා විසින්, පරිවාස නිලධරයකු හෝ පළාත් කොමසාරිස්වරයා විසින් තීරණය කරන ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සහ බලතල ඇති වෙනත් යම් නිලධරයකුට අවශ්‍ය පරිදි පරීක්ෂණයක් පවත්වා පළාත් කොමසාරිස්වරයා නිශ්චිතව දන්වන යම් කාලසීමාවක් තුළ දී වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වාර්තාව මගින්, අනෙකුත් කරුණු අතරට තාවකාලික අනුමතය ප්‍රදානය කිරීම සඳහා 4 වන වගන්තියෙහි නිශ්චිතව සඳහන් සුදුසුකම් සියල්ල සපුරාලීමෙන් ඉල්ලුම්කරු සුදුසුකම් ලබන බව ද සඳහන් කර තිබිය යුතු ය.

තාවකාලික අනුමතය ප්‍රදානය

(6) (1) 5 වන පගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ අඩංගු කරුණු පරීක්ෂාකර බැලීමෙන් පසුව පළාත් කොමසාරිස්වරයා විසින් -

*(අ)* ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට යෝජිත ප්‍රදේශයේ දැනටමත් පවත්නා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව පිළිබඳ සලකා බලා එම ප්‍රදේශය තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාව තීරණය කරලු ලැබ ;

*(ආ)* ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට යෝජිත පරිශ්‍රයට තමා විසින් පෞද්ගලිකව ම ගිය අවස්ථාවේ දී ඔහු විසින් ලබා ගැනීමට හැකි වූ වෙනත් තොරතුරක් මත ;

අදාළ සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුම සඳහා තාවකාලික අනුමතය ලබා දිය යුතු බව හෝ නොදිය යුතු බව පිළිබඳ තීරණය කළ යුතු ය.

(2) ළමා සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් පළාත් කොමසාරිස්වරයා නියම කරනු ලබන යම් තොරතුරක් සහ විස්තරයක් ලබා දීම ඉල්ලුම්කරුගේ වගකීම වන්නේ ය.

(3) ඉල්ලීමක් ලද දින සිට මාස තුනක කාලයක් තුළ දී පළාත් කොමසාරිස්වරයා විසින් යම් ඉල්ලීමක් පිළිබඳ තීරණය කළ යුතු වන අතර, පළාත් කොමසාරිස්වරයා -

*(අ)* තාවකාලික අනුමතය ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන විට ඒ බව අයදුම්කරු වෙත ප්‍රතික්ෂේප කිරීමට හේතු ද සහිතව ලිඛිතව දැනුම් දිය යුතු ය ; හෝ

*(ආ)* තාවකාලික අනුමතය ලබා දීමට තීරණය කරන විට දී, මෙම ප්‍රඥප්තියේ III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් තාවකාලික අනුමතය සඳහා වන සහතිකයක් නිකුත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිකුත් කරන ලද තාවකාලික අනුමත සහතිකයක්, එය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වන අතර, අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා නියම කරනු ලබන නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

ප්‍රදානය කළ කාලය තුළ දී ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම.

7. (1) 6 වන වගන්තිය යටතේ තාවකාලික අනුමත සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකුට ද එම තැනැත්තා විසින් එම අනුමත සහතිකය වලංගු කාලය ඉකුත් වීමට දින දහ හතරකට පෙර එම අනුමත සහතිකය අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවිය යුතු වන අතර, මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් එම ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීම සඳහා පළාත් කොමසාරිස්වරයා තීරණය කරනු ලබන පරිදි, මධ්‍යස්ථානය පිහිටුවීමේ කාර්ය අවසන් කළ බවට වාර්තාවක් අයදුම් පත්‍රයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ කාර්ය හය මසක කාලයක් තුළ අවසන් කිරීමට තාවකාලික අනුමත සහතිකය දරනු ලබන තැනැත්තා අපොහොසත් වන අවස්ථාවක දී, එම තැනැත්තා පළාත් කොමසාරිස් වෙත කරනු ලබන ලිඛිත අවසරයක් මත, උපරිම වශයෙන් මාස හයක් දක්වා කාලය දීර්ඝ කළ හැක.

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම.

8. (1) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති වාර්තාව සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම ලැබී මසක කාලයක් තුළ පළාත් කොමසාරිස්වරයා ඔහු විසින් ම හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද වෙනත් නිලධරයෙකු හරහා -

*(අ)* තාවකාලික අනුමත සහතිකය ලබාදුන් දින සිට යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කර ගන්නා ලද ළමුන්ගේ වැඩිම යහපත සහතික වන ආකාරයෙන් තම කටයුතු පවත්වා ගැනීමට එම ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ශක්තතාව පවතින බව; සහ

(ආ) එබැවින්, මෙම ප්‍රඥප්තියේ කාර්ය උදෙසා එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බව,

තීරණය කිරීම සඳහා අවශ්‍ය සහ සුදුසු පරීක්ෂණ හා කරුණු විමසීම් සිදු කළ යුතු ය.

(2) (1) වැනි උප වගන්තියේ සඳහන් කරුණු විමසීම් සහ පරීක්ෂණ සිදු කර අවසන් වූ පසු, පළාත් කොමසාරිස්වරයා -

(අ) එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් ලියාපදිංචි කර මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ වූ ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම; හෝ

(ආ) එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් ලියාපදිංචි කිරීම 9 වන වගන්තියේ සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් යටතේ ප්‍රතික්ෂේප කිරීම කළ යුතු ය. එසේ ප්‍රතික්ෂේප කිරීම ඔහුගේ හේතූන් ද සඳහන් කළ යුතු ය.

(3) (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක් වසර තුනක් කාලයක් සඳහා වලංගු වන අතර, අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා කලින් කල නියම කරන ලද යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ලියාපදිංචි සහතිකයක් ප්‍රදානය කිරීම පළාත් කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම් සහ අදාළ තැනැත්තාට ඒ වන විටත් තාවකාලික අනුමත සහතිකයක් ප්‍රදානය කර ඇත්නම්, එම සහතිකය අවලංගු කළ යුතු අතර, තාවකාලික අනුමත සහතිකය ප්‍රදානය කිරීමෙන් පසුව එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළත් කරගන්නා ලද ළමුන් වෙතොත් ඔවුන් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා.

9. 8 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් මත පළාත් කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය :-

(අ) එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලනය කිරීමට සහ පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඉල්ලුම්කරු සතු නොවන බව හෝ ඉල්ලුම්කරුට ඒවා ලබා ගැනීමට හැකියාව නොමැති බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන විට ;

(ආ) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සිටින ළමුන්ට අධ්‍යාපනය හෝ වෙනත් යම් පුහුණුවීම්, නවාතැන් පහසුකම්, භාරකත්වය, ආරක්ෂාව සහ නඩත්තුව සැලසීමට ඉල්ලුම්කරු අපොහොසත්ව ඇති බව හෝ ඒ සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා ගැනීමට අපොහොසත්ව ඇති බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත්ව ඇති විටක ;

(ඇ) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු හෝ එහි ස්වේච්ඡාවෙන් සේවය කරන කවර හෝ පුද්ගලයකු හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ යම් නිලධරයකු හෝ කාර්ය මණ්ඩලයේ වෙනත් තැනැත්තකු හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු හා සම්බන්ධ වෙනත් යම් නිලධරයකු අධිකරණයකින් වරදකරු වී ඇති බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත් වන විට ;

(ඈ) ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ හෝ එහි සේවය කරන යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පිළිබඳ අපකීර්තිය හෝ දුශ්චරිතවත් බව හේතුකොටගෙන එම තැනැත්තා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සාමාජිකයකුව සිටීමට හෝ ස්වේච්ඡා පදනමෙන් එහි සේවය කිරීමට හෝ එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන් සමග එක්ව කටයුතු කිරීමට නුසුදුසු තැනැත්තකු වන බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත්වන විට ;

(ඉ) යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් 12 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින්, නියම කරනු ලැබූ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වූ අවම ප්‍රමිති පවත්වාගෙන යාමට අපොහොසත්ව ඇති බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමකට පත්ව ඇති විට, හෝ

(ඊ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින්, කළින් කල තීරණය කරනු ලබන වෙනත් යම් හේතුන් මෙවැනි දැන්වීම් මාස තුනක් ඇතුලත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. ;

(උ) පළාත් කොමසාරිස්වරයා විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන විට අමාත්‍යවරයා වෙත අභියාචනාවක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඉල්ලුම්කරුට ඇත. එය අධ්‍යනය කරනු පිණිස සුදුසු තුන් දෙනෙකුගෙන් සමන්විත කමිටුවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ළමුන් ඇතුළත් කිරීම සහ කළමනාකරුගේ කාර්ය.

10. (1) ළමයකු ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ;

(අ) පළාත් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමතය රහිතව ; සහ

(ආ) වයස සීමාව, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගමික පදනම මත සිදුකළ වෙනත් වර්ග කිරීමක් හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කරන අවස්ථාවේ දී පළාත් කොමසාරිස් විසින්, නිර්ණය කරනු ලැබූ වෙනත් යම් කරුණක් උල්ලංඝනය කර ඇත්නම්,

ඇතුළකත් නොකළ යුතු ය.

(2) (1) වැනි උප වගන්තියේ සඳහන් විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් ළමයකුගේ ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාව අනතුරේ හෙළන්නා වූ හෝ හානියක් හෝ තර්ජනයක් වන බවට පෙනී යන්නා වූ තත්ත්වයකට එකී ළමයා මුහුණ දී ඇත්නම් පළාත් කොමසාරිස්ගේ පූර්ව අනුමතය නොමැතිව එකී ළමයා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කළ හැකි ය.

(3) (2) වැනි උපවගන්තිය යටතේ ළමයකු ඇතුළත් කිරීම පිළිබඳව ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකාරවරයා විසින්, පරිවාස නිලධාරියාට ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරියාට හෝ ජාතික ළමා රක්ෂක අධිකාරියේ නිලධාරියාට පැය විසිහතරක කාලයක් තුළ දී දැනුම් දිය යුතු වන අතර, එම ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සති දෙකක් තුළ පළාත් කොමසාරිස්වරයාගේ අනුමතය ලබාගත යුතු වේ.

(4) යම් ළමයකුගේ ජීවිතය සෞඛ්‍යය හෝ ආරක්ෂාව අනතුරේ හෙළන හෝ එයට හානියක් හෝ තර්ජනයක් එල්ල කරන යම් තත්ත්වයකට ළමයකු පත්ව ඇති අවස්ථාවක දී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු පැය විසි හතරක් තුළ අවශ්‍ය පියවර ගත යුතු වේ.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇති ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට අධිකරණයකින් වරදකරු කරනු ලැබූ හෝ අපයෝජනයට ලක් වූ ළමයකු ඇතුළත් කර නොගත යුතු ය.

ලියාපදිංචි සහතික අළුත් කිරීම.

11. නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය අළුත් කරවා ගැනීමට එහි වලංගු කාලය ඉකුත් වීමට මාස තුනකට පෙර ඉල්ලුම් කළ යුතු වන අතර, එකී අළුත් කිරීමේ අයදුම්පතක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ වූ විධිවිධාන අවශ්‍ය වනතාක් දුරට අදාළ විය යුතු ය.

12. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් විසින්, පවත්වාගත යුතු අවම ප්‍රමිති නිර්ණය කරනු ඇති අතර, එලෙස නිර්ණය කරන ලද අවම ප්‍රමිතිවලට තරයේ අනුකූලවීමට ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකාර මණ්ඩලයේ වගකීම වන්නේ ය. එවැනි නියෝග ගැසට් පත්‍රයේ පළ කර මාස තුනක කාලයක් තුළ උතුරු පළාත් සභාවට ඉදිරිපත් කර එය උතුරු පළාත් සභාව විසින් අනුමත කළ යුතු වේ.

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය මගින් අවම ප්‍රමිති පවත්වාගත යුතු බව.

(2) හදිසි අවස්ථාවක දි (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වන ලද අවම ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවෙන් පළාත් කොමසාරිස් විසින්, යම් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් නිශ්චිත කාලසීමාවක් සඳහා මුක්ත කළ හැක.

## II වන කොටස
## පරීක්ෂකවරු සහ විශේෂ නිරීක්ෂකයන්

13. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාතේ කොමසාරිස් විසින්, නමින් හෝ තනතුරින් යම් රාජ්‍ය නිළධාරියකු හෝ යම් විශ්‍රාමික රාජ්‍ය නිළධරයකු උතුරු පළාතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂක හෝ පරීක්ෂකවරු ලෙස පත් කළ යුතුය.

පරීක්ෂකවරු පත් කිරීම.

(2) (1) වැනි වගන්තිය යටතේ පත් කළ පරීක්ෂකවරයෙක්, තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කොමසාරිස්වරයා විසින් නිකුත් කළ උපදෙස් සහ විධානවලට අනුව කටයුතු කළ යුතු අතර, ඔහුගේ බලතලවලට ද යටත් වේ.

14. (1) පළාත් කොමසාරිස් හෝ 13 වන වගන්තිය යටතේ පත් කළ පරීක්ෂකවරයකු විසින්, ලියා පදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඕනෑම වේලාවක ඇතුළු වී පරීක්ෂා කළ හැකි අතර, එම කාර්ය සඳහා සහ එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන්ගේ වැඩීම යහපත තහවුරු කිරීම උදෙසා ඔහු සිතන පිරිදි අවශ්‍ය කවර හෝ කරුණක් පිළිබඳ විභාග කළ හැකි අතර, එයට ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ආකාරය සහ කළමනාකරණය. පවත්නා තත්වය ළමුන් රැකබලා ගන්නා ආකාරය සහ එහි නේවාසික සෑම ළමයකු සම්බන්ධයෙන් ම වාර්තා පවත්වාගනු ලබන බව ද එම කරුණුවලට අඩංගු විය යුතුය.

ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම හා අධීක්ෂණය

(2) (1) වන උප වගන්තිය යටතේ සිදු කළ පරීක්ෂාවකින් පසුව සෑම පරීක්ෂකවරයකු ම පළාත් කොමසාරිස්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

15. (1) අමාත්‍යවරයා විසින්, නමින් හෝ තනතුරින් උතුරු පළාතේ ලියාපදිංචි සෑම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා ම විශේෂ නිරීක්ෂකයන් වශයෙන් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් එක් අයකුට වැඩි ප්‍රමාණයක් පත් කළ හැකි ය.

විශේෂ නිරීක්ෂකයන් පත් කිරීම.

(2) අමුත්තකු ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකු ප්‍රඥප්තියේ 14 වන වගන්තියෙන් පරීක්ෂකවරයකු වෙත ප්‍රදානය කර ඇති බලතල තමා නැරඹීමට යන සෑම ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් විෂයයෙන් ම ක්‍රියාත්මක කළ හැකි ය.

(3) (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන සෑම පරීක්ෂාවක් ම අවසානයේ දී සෑම පරීක්ෂකවරයකු ම පළාත් කොමසාරිස්වරයාට ද පිටපතක් සහිතව අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

## III වන කොටස
## ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වසා දැමීම, අත්හිටුවීම හෝ ලියාපදිංචි සහතිකය අවලංගු කිරීම

ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වසා දැමීමේ දී, අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

16. (1) උතුරු පළාතේ ප්‍රඥප්තිය මගින් සංස්ථාපිත ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානයක් හෝ ආයතනයක් විසින් ලියා පදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කරගත හොත් එකී ස්වේච්ඡා සංවිධානය හෝ ආයතනය විසින් එම යෝජනා සම්මතය පිලිබඳව පළාත් කොමසාරිස්වරයාට වහා ම දැනුම් දිය යුතු ය.

(2) (1) වන වගන්තිය යටතේ වන සෑම යෝජනා සම්මතයක් ම එම යෝජනා සම්මතයේ දින සිට හය මසක කාලයකින් පසුව ක්‍රියාත්මක විය යුතුය.

(3) ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික යම් ළමයෙකු එම මධ්‍යස්ථානයෙන් ඉවත් කරන තෙක් අකණ්ඩ වූ එකී ළමයාගේ භාරකාරත්වය දැරීම. ළමයාට ආරක්ෂාව සහ නඩත්තු සැපයීම එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේ ය.

(4) එකී යෝජනා සම්මතයක් ඇතිකර ගත් දිනයේ දී එකී ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය එහි නමින් හෝ එය වෙනුවෙන් ලද හෝ දරන ලද සියලු චංචල සහ නිශ්චල දේපළ පළාත් කොමසාරිස්වරයා වෙත පැවරෙනු ලැබිය යුතුය.

ලියාපදිංචි සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

17. (1) 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්-

(අ) අසත්‍ය, නොමග යවන සුළු හෝ වැරදි තොරතුරු සැපයීමෙන් ලබාගත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් බවට හෙළිදරවු වුවහොත්,

(ආ) මෙම පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක, උපදෙසක හෝ නියමයක විධිවිධානවලට පටහැනිව ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ කළමනාකරු හෝ යම් සාමාජිකයෙක් ක්‍රියාකර ඇති බවට හෙළිදරවු වුවහොත්,

(ඇ) ළමුන්ගේ ආරක්ෂාවට ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය තර්ජනයක් බවට පත් වුවහොත්, සහ

(ඈ) උපදෙස් සහ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය සිතාමතා පැහැර හැරිය හොත්,

අත්හිටුවීමට හෝ අවලංගු කිරීම කල යුතු ය.

(2) අවස්ථානුකූලව නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම (1) වන උප වගන්තිය යටතේ සිදු කර ඇත්නම් කළමනාකරු විසින් ලබා දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් කරන ලද ලිඛිත දැන්වීමක් මගින් එකී අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව කලමනාකරුට වහාම දැනුම් දීම පළාත් කොමසාරිස්ගේ වගකීම වන්නේ ය.

(3) (1) වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවලංගු කර ඇත්නම්. එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නමින් හෝ ඒ වෙනුවෙන් ලද හෝ දරන ලද සියලු චංචල හා නිශ්චල දේපළ පළාත් කොමසාරිස්වරයා වෙත පැවරෙනු ලැබිය යුතුය.

පළාත් කොමසාරිස්වරයා විසින් සාමාන්‍ය හා විශේෂ උපදෙස් ලබා දීම.

18. (1) පළාත් කොමසාරිස්

(අ) ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පරිපාලනය කරන ආකාරය සතුටුදායක නොවන බව,

(ආ) එවැනි ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ළමුන් වෙනුවෙන් පවත්නා පහසුකම් ප්‍රමාණවත් නොවන බවට හෝ එහි නේවාසික ළමුන්ගේ සුබ සිද්ධියට හිතකර නොවන බව,

(ඇ) ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන්ගේ සුබ සිද්ධියට හා ආරක්ෂාවට ළමුන් බලාගන්නා ආකාරය අයහපත් අයුරින් බලපාන බව,

(ඈ) ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රමිති පවත්වා නොගෙන ඇති බව, හෝ,

(ඉ) 8 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නියම කර ඇති යම් නියමයකට සහ කොන්දේසියකට අනුකූලව කටයුතු කර නොමැති බව,

පළාත් කොමසාරිස්වරයාගේ අදහස වන්නේ නම්, එකී තත්ත්වය ප්‍රකෘති තත්ත්වයට පත් කරනු සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයට විශේෂ හෝ සාමාන්‍ය උපදෙස් ලබාදීමට පළාත් කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය.

(2) (1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් උපදෙසකට අනුකූලව කටයුතු කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම විය යුතු ය.

(3) (1) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ නියමයක් -

ප්‍රමාණවත් හේතු දැක්වීමට අපොහොසත් වුවහොත් අදාළ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචි සහතිකය අවලංගු කරමින් මහෙස්ත්‍රාත්වරයා නියෝගයක් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචි සහතිකය අවලංගු කළ විට, පළාත් කොමසාරිස්වරයාට, පරීක්ෂකවරයෙකුට හෝ තත් කාර්ය සඳහා පළාත් කොමසාරිස් විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තෙකුට එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළුවීමට සහ -

(අ) එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන් ඉවත්කර උතුරු පළාත තුළ ඇති වෙනත් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට,

(ආ) ළමුන් දෙමාපියන්වෙත භාර දීමට හෝ,

(ඇ) පළාත් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයකට යැවීමට;

බලය ඇත්තේ ය.

(4) (2) වන වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි සහතිකය අවලංගු කර ඇති විට දී, ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නමට හෝ ඒ වෙනුවෙන් ලැබෙන හෝ දරන චංචල සහ නිශ්චල දේපල එම අවලංගු කළ දින සිට පළාත් කොමසාරිස් වෙත පැවරෙනු ලැබිය යුතු ය.

අභියාචනා ඉදිරිපත් කිරීමට අයිතිය ඇති බව.

20. (1) 19 වන වගන්තියේ (2) උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකුට අපරාධ නඩු කටයුත්තක් හෝ කරුණක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා ප්‍රකාශ කරන ලද අවසාන නියෝගයක් සේ එකී නියෝගය සලකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද අදාළ මහාධිකරණයක් වෙත අභියාචනා කල හැකි අතර. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 320 සහ 330

(එම වගන්ති දෙක ද ඇතුළුව) සහ 357 සහ 358 වගන්ති ද අවශ්‍ය වෙනස්කම් සහිතව එකී අභියාචනයට අදාළ විය යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ තම අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයක තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකුට මහාධිකරණයේ අවසරය මත නීතිමය කරුණක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීමට හැකි අතර, මහාධිකරණය විසින් අවසර ලබා නොදෙන්නේ නම්, ඒ සඳහා පළමුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ අවසරය ලබා ගත යුතු වේ.

අභියාචනය පිළිබඳ නියෝගයක් කළ යුතු බව.

21. පළාත්බද මහාධිකරණයකට 20 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සිදුකළ අභියාචනයක් සම්බන්ධයෙන් පහත යම් නියෝගයක් සිදු කිරීමට බලය ඇත්තේ ය. එනම්-

(අ) මහෙස්ත්‍රාත් අධිකරණය මගින් දෙන ලද නියෝගය තහවුරු කිරීමට. ප්‍රතික්ෂේප කිරීමට හෝ වෙනස් කිරීමට ;

(ආ) මහෙස්ත්‍රාත් ඉදිරියේ හේතු දැක්වීමට කළමනාකාර මණ්ඩලයට අවසර දීමට ; හෝ,

(ඇ) නඩු කටයුත්තේ සිදුවීම් අනුව යුක්ති සහගත ලෙස සැලකිය හැකි වෙනත් යම් නියෝගයක් කිරීමට.

ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකින් ළමුන් මාරු කර යැවීම.

22. (1) ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නේවාසික යම් ළමයෙකු වෙනත් තැනකට යැවීම සම්බන්ධයෙන් පළාත් කොමසාරිස්වරයා විසින්. නිකුත් කරනු ලබන යම් විධාන හා උපදෙස්වලට එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරු විසින් අනුකූලව කටයුතු කල යුතු වන අතර, එවැනි ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නේවාසික ළමයකු වෙනත් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට මාරු කර යැවීම හෝ කවර ආකාරයෙන් හෝ එකී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීම පළාත් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය රහිතව සිදු නොකළ යුතු ය.

(2) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරු, එකී මධ්‍යස්ථානයේ නේවාසික ළමයකු මාරුකර යැවීම සම්බන්ධයෙන් එම ළමයාගේ මතයට සවන් දිය යුතු අතර, ළමයාගේ වැඩිම යහපත යන කරුණ වැදගත් කොට සැලකිය යුතු ය.

(3) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ස්ථානගත කිරීමේ කමිටුවෙන් එකී ළමයා ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ වසර තුනකට අධික කාලයක් රඳවා ගැනීමට තීරණය කිරීමේ දී, එකී තීරණය සඳහා පළාත් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව එම තීරණය ක්‍රියාත්මක නොකළ යුතු ය.

ලියාපදිංචි සහතිකයක් අවලංගු කිරීමේ ප්‍රතිඵල.

23. (1) ලියාපදිංචි සහතිකය අවලංගු කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට යම් ළමයකු ඇතුළත් නොකළ යුතු ය.

(2) අවස්ථානුකූලව යම් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ලියාපදිංචි සහතිකය අවලංගු කරන අවස්ථාවක දී හෝ අභියාචනයක් අනතුරුව අවලංගු කිරීම තහවුරු කරන අවස්ථාවක දී අදාළ මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින ළමුන් එම ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඉවත් කරන තෙක් අඛණ්ඩව ඔවුන්ගේ භාරකාරත්වය, ආරක්ෂාව සහ නඩත්තුව දැරීමට එකී මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය කටයුතු කළ යුතු ය.

## IV වන කොටස
## උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය

උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය.

24. (1) ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචි සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම නිසා හෝ තාවකාලික අනුමත සහතිකය ලියාපදිංචි සහතිකයක් බවට පත් නොකරන ලද අවස්ථාවක දී හෝ මෙම පනත යටතේ ලියාපදිංචි සහතිකය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක දී ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකින් ඉවත් කරනු ලබන යම් ළමයකු භාර ගැනීම, භාරකාරත්වය දැරීම, ආරක්ෂාව සහ නඩත්තුව සැලසීම සඳහා උතුරු පළාත් සභාව විසින්, උතුරු පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම පරිපාලනය සහ නඩත්තු කිරීමේ දී පැන නගින සෑම වියදමක් ම උතුරු පළාත් සභාවේ පළාත් අරමුදලින් ගෙවිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, මෙම වගන්තිය යටතේ පිහිටුවන ලද උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලනය කිරීම සඳහා නමින් හෝ තනතුරින් යම් තැනැත්තෙකු එහි පාලකයා වශයෙන් සහ අවශ්‍ය වෙනත් නිලධාරීන් සහ සේවකයන් සංඛ්‍යාවක් ද පත් කළ යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් කළමනාකරණය කිරීමට කළමනාකරණ මණ්ඩලයක් වෙත භාර දිය යුතු අතර. එම කළමනාකරණ මණ්ඩලය එහි සභාපතිවරයා වන පළාත් කොමසාරිස්වරයාගෙන් ද , අමාත්‍යවරයා විසින් පත් කළ වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සහ මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකයා ලෙස පත් කරනු ලැබූ තැනැත්තාගෙන් ද සමන්විත විය යුතු වේ.

උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරයාගේ කාර්ය.

25. (1) උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පාලකවරයා කලින් කල එකී උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන විධාන සහ පළාත් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් සහ විධි විධානවලට අනුකූලව තම තනතුරෙහි කාර්ය ඉටු කළ යුතු ය.

(2) උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළත් කරගනු ලබන ළමුන්ට ප්‍රමාණවත් මට්ටමේ භාරකාරත්වයක්, ආරක්ෂාවක් සහ නඩත්තු සැපයීම සහතික කිරීමට අවශ්‍ය සියලු පියවර පාලකවරයා විසින් ගත යුතු අතර, අවස්ථානුකූලව එකී ළමුන් හැකිතාක් ඉක්මණින් දිස්ත්‍රික්කය තුළ පිහිටි ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වෙත මාරු කර යැවීමට හෝ පෙරලා දෙමාපියන් වෙත බාරදීමට අවශ්‍ය සියලු පියවර ද ගත යුතු ය.

(3) ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් වෙත ළමුන් මාරු කර යැවීමට පාලකවරයා කටයුතු කරනු ලබන අවස්ථාවකදී එම කාර්ය සඳහා ඔහු විසින් පළාත් කොමසාරිස්ගේ පූර්ව අනුමතය ලබා ගත යුතුය. පළාත් කොමසාරිස්වරයා විසින්, එම අනුමතය ලබාදීම පරිවාස නිලධාරියාගෙන් වාර්තාවක් ලැබීමෙන් අනතුරුව සිදු කළ හැකි ය.

## V වන කොටස
## භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන

වයස අවුරුදු පහට අඩු දරුවන් සඳහා රැකවරණය.

26. (1) වයස අවුරුදු පහට අඩු අනාථ හෝ අත්හළ ළමුන් නේවාසිකගත කිරීම, ස්ථානගත කිරීම සහ ආරක්ෂා කිරීම පළාත් භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන් තිබිය යුතු අතර, ඒවා උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පාලනයට යටත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් භාරගැනීම මගින් පමණක් ම කළ යුතු වේ.

(2) අවුරුදු පහකට අඩු ළමයකු අනාථ වී ඇති බව හෝ අත්හරිනු ලැබ ඇති බව යම් තැනැත්තකු දැනගත් විගස ඒ බව ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති හෝ යම් පොලිස් නිලධාරියෙකු වෙත හෝ උතුරු පළාතේ පිරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වෙත හෝ ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරියකු වෙත හෝ දැනුම්දීම එම තැනැත්තාගේ වගකීමක් වන්නේ ය.

(3) (2) වන උප වගන්තියේ සඳහන් වන පරිදි දැන්වීම් ලද යම් නිලධාරියකු විසින් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඒ ළමයා ළඟම ඇති රජයේ රෝහලකට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) රෝහලකට ඇතුළත් කරනු ලැබූ ළමයකුට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමෙන් පසු එම ළමයාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම අවශ්‍ය නොවන බවට වෛද්‍ය පරීක්ෂණයෙන් හෙළි වුවහොත් එම රෝහල භාර වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම ළමයා උතුරු පළාතේ භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කළ යුතු ය.

උපත ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

27. (1) අනාථ හෝ අත්හරිනු ලබන ළමයෙකු ලෙස දක්නට ලැබූ අවස්ථාවක එම උපත ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මූලික කටයුතු රෝහලේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධාරියකු විසින් හෝ ළමයා රෝහලින් මුදා හැරීමට ප්‍රථම කළ යුතු ය.

(2) එකී උපත යථා පරිදි ලියාපදිංචි කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව පළාත් කොමසාරිස්වරයාට වහාම දැනුම් දීම රෝහල් අධ්‍යක්ෂවරයාගේ කාර්ය විය යුතු අතර, පළාත් කොමසාරිස්වරයා විසින් එකී ළමයා උතුරු පළාතේ භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් කිරීමට සියලු පියවර ගත යුතු ය.

පරීක්ෂණ වාර්තාවක් ලබාදිය යුතු බව.

28. උතුරු පළාත් භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකු පිළිබඳව සම්පූර්ණ විස්තර සහිත වාර්තාවක් පළාත් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම අංශය බාර පරිවාස නිලධාරියා විසින් හෝ කොමසාරිස් විසින් බලය පවරනු ලබන අංශයේ වෙනත් නිලධාරියෙකු විසින් කළ යුතුය. එම වාර්තාව ළමයා භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය ඇතුළත් කළ දින සිට දින 30ක් ඇතුළත ළමයා පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව පළාත් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

ස්ථාපන කටයුතු කිරීම.

29. උතුරු පළාතේ භාරගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්ට ඇතුළත් කරනු ලබන ළමයින්ගේ ස්ථාපන කටයුතු සම්බන්ධ සියලු කාර්ය පළාත් කොමසාරිස්වරයා විසින් කළ යුතු ය. ඒ සඳහා ඔහුට ස්ථාපන කමිටුවේ සහාය ලබා ගත හැකි ය.

## **VI** වන කොටස

## මුදල

අරමුදල සැපයීම.

30. (1) මධ්‍යම රජය මගින් ලබාදෙන හෝ උතුරු පළාත් සභාව මගින් එහි වාර්ෂික ඇස්තමේන්තුව යටතේ ලබාදෙන පළාත් අරමුදලක් හෝ වෙනත් මූල්‍ය ප්‍රභවයක් හෝ පරිත්‍යාග වශයෙන් ලබාදෙන මුදලක් හෝ අරමුදලක් පළාත් කොමසාරිස් විසින් මෙම ප්‍රඥප්තිය මගින් හෝ එය යටතේ ඔහු වෙත පැවරී ඇති කටයුතු ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා යොදා ගත හැකි ය. සැපයෙන මුදල් හෝ අරමුදලේ එම කාර්යය සඳහා භාවිතා කළ යුතු ය.

(2) පළාත් කොමසාරිස්වරයා විසින්, මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුගේ කාර්යය ඉටු කිරීම සඳහා ඔහු වෙත ලැබුණු සියලු අරමුදල් පිළිබඳ ගිණුම් වාර්තා යථා පරිදි පවත්වාගත යුතු වේ.

(3) විගණනය සම්බන්ධව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1), 23 (2) වගන්ති අදාළ වන අතර, ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ගිණුම්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථා සංග්‍රහයට අනුව විගණකාධිපති විසින් පත් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් වාර්ෂිකව විගණනය කිරීම කළ යුතු ය.

ගිණුම් විගණනය.

31. සෑම ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාර්ෂික අයවැය හා ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් විගනනය කර වාර්ෂිකව පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## VII වන කොටස
## වැරදි

ප්‍රඥප්තියේ විවිධිධානවලට පටහැනි ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම හෝ පවත්වාගෙන යාම වරදක් බව.

32. *(අ)* ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා තාවකාලික අනුමත සහතිකය ලබා ගැනීමෙන් තොරව එවැනි මධ්‍යස්ථානයක් පිහිටුවන හෝ තාවකාලික අනුමත සහතිකය අවලංගු කිරීමෙන් පසු ව ද ළමා සංවර්ධන සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන,

*(ආ)* මෙම ප්‍රඥප්තිය යටතේ වූ තාවකාලික අනුමත සහතිකය වලංගු කාලය ඉකුත් වූ පසුව ද ලියාපදිංචි වීමකින් තොරව ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යන හෝ පරිපාලනය කරන ; හෝ

*(ඇ)* ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ බලපත්‍රය අවලංගු කිරීමෙන් පසුව ද එම මධ්‍යස්ථානය පවත්වාගෙන යන,

යම් තැනැත්තෙක් හෝ පුද්ගලයෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම එකවර යටත්විය යුතු ය.

තොරතුරු සැපයීමට අපොහොසත් වීම හෝ අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම වරදක් වන බව.

33. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ලබාදීමට නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් ලබා දීම පැහැර හරින හෝ ලබාදීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභායකින් වරදකරු කරනු ලැබීමෙන් පසු -

*(අ)* එම වරද සිදු කරනු ලබන්නේ ප්‍රථම වතාවට නම්, රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට ; හෝ

*(ආ)* එම වරද සිදු කරනු ලබන්නේ දෙවන වතාවට නම් හෝ ඊට වැඩි වාර ගණනකදී නම්, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් වාර්තාවකට හෝ ඉල්ලුම් පත්‍රයකට සිතාමතාම අසත්‍ය තොරතුරු සපයන හෝ අසත්‍ය හෝ වැරදි ප්‍රකාශ සිදු කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු -

*(අ)* එම වරද සිදු කරනු ලබන්නේ ප්‍රථම වතාවට නම්, රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයක් ද ; හෝ

(ආ) එම වරද සිදු කරනු ලබන්නේ දෙවන වතාවට නම් හෝ ඊට වැඩි වාර ගණනකදී නම්, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටමද,

පළාත් කොමසාරිස්වරයා වැනි අයට බාධා කිරීම වරදක් බව.

34. පළාත් කොමසාරිස් පරිවාස නිලධාරියකු, පරීක්ෂකවරයකු හෝ හමුවීමට පැමිණෙන්නකු හෝ මෙම පනත මගින් හෝ එය යටතේ පළාත් කොමසාරිස් විසින්, බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකුට පැවරී ඇති කාර්ය ඉටු කිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේ දී හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කොමසාරිස්වරයා, පරිවාස නිලධාරියා, පරීක්ෂකවරයකු හමුවීමට පැමිණෙන්නෙකු හෝ පළාත් කොමසාරිස් විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු වළක්වන හෝ බාධා කරන යම් තැනැත්තකු මෙම පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් විසිපන් දහස නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

පොදු දඬුවම්.

35. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පැනවූ යම් නියෝගයකට, විධානයකට හෝ නියමයකට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ හයමසකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් මගින් කරන වැරදි.

36. මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරන වැරැද්දක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කර ඇත්නම් සහ එම පුද්ගල මණ්ඩලය -

(අ) අවස්ථානුකූලව, ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් හෝ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරිපාලනය කරන කළමනාකරණ මණ්ඩලය වන විට, එම කළමනාකාරණ මණ්ඩලයේ සියලු සාමාජිකයන් ද ;

(ආ) සංස්ථාපිත මණ්ඩලයක් වන විට, එම සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයකු ම, කළමනාකරුවකු ම, ලේකම් හෝ නිලධරයකු ම ; හෝ

(ඇ) සමාගමක වන විට, එම සමාගමේ සෑම හවුල්කරුවකුම සහ සෑම කළමනාකරුවකු ම, එම වරද සිදුකරන ලද්දේ තම කැමැත්ත හෝ අනුමතය නොමැතිව බව සහ එය වළක්වාලීමට සියලු ප්‍රයත්න ඔහු විසින් දරන ලද බව ඔහු විසින් ඔප්පු කරනතේ නම් මිස, එක්ව සහ තනිතනිව එම වරද සිදු කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

කළමනාකාරවරයකු

37. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකාරවරයා කළමනාකරන මණ්ඩලයේ සාමාජිකයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කර ඇත්නම්, එම වරද සම්බන්ධයෙන් පැනවිය හැකි දඬුවම් නියම කිරීමට අතිරේකව එකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අවලංගු කිරීමට ද මහේස්ත්‍රාත්වරයෙකුට බලතල ඇත්තේ ය.

## VIII වන කොටස
## වෙනත් කරුණු

පළාත් කොමසාරිස්වරයා විසින් සහනාධාර ගෙවීම.

38. ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරු විසින් එම මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින ළමුන් වෙනුවෙන් සහනාධාර ඉල්ලීම් කරන ලද ඉල්ලීමකට අනුව අමාත්‍යවරයා විසින් වාර්ෂිකව නියම කරන මුදලක් එක් එක් ළමයාගේ සුබ සාධනය උදෙසා නේවාසික එක් එක් ළමයාට ගෙවන නඩත්තු දීමනාවක් වශයෙන් මුදලක් පළාත් කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

නියෝග.

39. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාවට නංවාලීමේ කාර්ය උදෙසා නියෝග සෑදිය හැකි ය.

(2) (1) වැනි උප වගන්තියෙන් පවරා ඇති බලතලවලට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින්, පහත එක් කරුණක් හෝ සියලු කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය.

*(අ)* මෙම ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කරුණු ;

*(ආ)* මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කළ යුතු යම් වාර්තාවක ඇතුළත් විය යුතු කරුණු ;

*(ඇ)* පළාත් කොමසාරිස්වරයා විසින් පවත්වාගත යුතු පොත් හා ලැයිස්තු සහ ඒවායේ ඇතුළත් කළ යුතු කරුණු ;

*(ඈ)* ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පරීක්ෂා කිරීමේ කාර්ය පටිපාටිය ;

*(ඉ)* ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ළමුන් ඇතුළත් කළ හැකි හෝ ඉන් ළමයකු ඉවත් කළ හැකි අවස්ථා ; සහ

*(ඊ)* මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාවට නංවාලීම සඳහා අවශ්‍යවන වෙනත් කරුණක් ;

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලු නියෝග *ගැසට් පත්‍රයේ* පළ කර ඒ පළ කරන ලද දින සිට මාස තුනක කාලයක් තුළ උතුරු පළාත් සභාවේ අනුමතය ලබා ගැනීම සඳහා උතුරු පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

(4) උතුරු පළාත් සභාව විසින් අනුමත නොකරන ලද සියලු නියෝග එම අනුමතය ප්‍රතික්ෂේප කළ දින සිට, ඒ යටතේ ඉන් පෙර සිදු කරන ලද යම් ක්‍රියාවකට අගතියක් සිදු නොවන සේ, අවලංගු වූවා සේ සැළකිය යුතු ය.

(5) යම් නියෝගයක් අවලංගු වූවා යැයි සැළකෙන දිනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීමකින් දැනුම් දිය යුතු ය.

පළාත් කොමසාරිස්වරයාට වාර්තා ඉදිරිපත් කිරීම.

40. (1) මෙම ප්‍රඥප්තියේ V වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් පළාත් කොමසාරිස්වරයාට සෑම මාස තුනකට වරක් ඉදිරිපත් කිරීම ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරුවාගේ වගකීම වන්නේ ය.

(2) (1) වැනි උපවගන්තියේ සඳහන් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද පළාත් කොමසාරිස්වරයා හෝ ඔහු වෙනුවෙන් බලයලත් වෙනත් යම් නිලධරයකුට, ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක නේවාසික ළමුන්ගේ වැඩිම යහපත සහතික කරලීම සඳහා අවශ්‍ය යැයි සැළකෙන ඕනෑම තොරතුරක් ඉදිරිපත් කරන ලෙසට ඒ කාර්ය සඳහා නිකුත් කරන ලද දැන්වීමක් මගින් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරුවකුට නියම කළ හැකි ය. එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ දී අවස්ථානුකූලව එම වාර්තාව හෝ තොරතුරු ඉදිරිපත් කිරීම එම කළමනාකරුගේ වගකීම වන්නේ ය.

ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වාර්ෂික මූල්‍ය ප්‍රකාශය.

41. (1) සෑම ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයක්, ඒ කාර්ය උදෙසා ස්වේච්ඡා සංවිධානයක හා සංස්ථාපිත ආයතනයක වාර්ෂික මහසභා රැස්වීමේ දී පත්කර ගන්නා ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සකස් කළ යුතු වන අතර, එලෙස සකස් කළ මූල්‍ය ප්‍රකාශය වාර්ෂික මහසභා රැස්වීමේ දී සම්මත කරගත යුතු ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරු විසින් සෑම වසරකම අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර පළාත් කොමසාරිස්වරයා වෙත කළමනාකාරවරයා විසින් ඉදිරිපත් කළ යුතු වේ.

ළමා නිවාස ලියාපදිංචි කිරීම.

42. උතුරු පළාත තුළ පිහිටුවන ලද යම් ළමා නිවාසයක් උතුරු පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇත යන කරුණ නොසලකා එම ළමා නිවාසය මෙම ප්‍රඥප්තියේ අර්ථ දැක්වීම තුළ "ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්" වන්නේ නම් එම ළමා නිවාසය මෙම පනත යටතේ ලියාපදිංචි විය යුතු ය.

අර්ථ නිරූපනය

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ ප්‍රඥප්තියේ"

"ළමා සංවර්ධන මධ්‍යස්ථානය" යන්නෙන් අනාථ හා අත්හල, ළමයින් භාර ගැනීම ඔවුන් නේවාසිකව තබා ගැනීම, ඔවුන්ට භාරය හා ආරක්ෂාව සැපයීම සඳහා සම්පූර්ණයෙන් ම හෝ කොටසක් ස්වේච්ඡා අරමුදල් මගින් පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් අදහස් වේ ;

"අත්හළ" යන්නෙන් නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් සම්බන්ධයෙන් වන විට දෙමව්පියන් දෙදෙනා ම විසින් අත්හල හෝ එක් දෙමාපියෙක් මියයාම හෝ දෙමාපියකු ලෙස කටයුතු කිරීමට අපොහොසත් වීම නිසා එක් දෙමාපියකු විසින් අත්හළ හෝ දෙමාපියන් දෙදෙනාටම දෙමාපියන් ලෙස කටයුතු කිරීමට අපොහොසත්වීම නිසා අත්හළ හෝ ළමයකු නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් මව විසින් අත්හල හෝ දෙමව්පියකු ලෙස කටයුතු කිරීමට අපොහොසත් වීම නිසා මව විසින් අත්හළ ළමයකු අදහස් වේ ;

"පරීක්ෂක" යන්නෙන්, මෙම ප්‍රඥප්තියේ 13 වගන්තිය යටතේ පළාත් කොමසාරිස්වරයා විසින් පත් කරන ලද ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පරීක්ෂකවරයෙක් අදහස් වේ ;

"කළමනාකරු" යන්නෙන් ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකාරීත්වය පිළිබඳ වගකීම දරන තැනැත්තා ස්ථාපනය නොකරන ලද ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් වන විට එය ස්ථාපනය කළ පසු කළමනාකරු වශයෙන් පත් කිරීමට යෝජිත තැනැත්තා අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, උතුරු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"අනාථ" යන්නෙන්, නීත්‍යානුකූලව විවාහ වූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් දෙමාපියන් දෙදෙනා ම හෝ එක් දෙමාපියකු මිය ගොස් අනෙක් තැනැත්තාට දෙමාපියන් ලෙස කටයුතු කිරීම අපොහොසත් වන මියගිය හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ දෙමාපියන්ට උපන් ළමයෙක් නම් මව මියගිය ළමයකු අදහස් වේ ;

"පරිවාස නිලධාරියා" යන්නෙන්, වරදකරුවන් පරිවාස භාරයට ගැනීමේ ආඥාපනතේ (24 වැනි අධිකාරය) 17 වැනි වගන්තිය අනුව පත් කරන ලද නිලධරයකු අදහස් වේ ;

"උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය" යන්නෙන්, මෙම ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවන ලද උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය අදහස් වේ ;

"උතුරු පළාත් භාර ගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය" යන්නෙන්, මෙම පනතේ 26 වැනි වගන්තිය යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන ආයතනයක් අදහස් වේ ;

"ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්" යන්නෙන්, මෙම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් අදහස් වේ ;

"පාලකයා" යන්නෙන්, මෙම ප්‍රඥප්තියේ 25(3) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ලියාපදිංචි කළ උතුරු පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය භාර තැනැත්තකු අදහස් වේ ;

ඉතිරි කිරීම.

44. (1) අනත්දරු ආඥාපනත (142) වන අධිකාරය යටතේ ලියාපදිංචි කරනු ලැබ මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විට, ක්‍රියාත්මකව පවත්නා අනාථ නිවාසයක් මෙම ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් වුව ද සහ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මෙම ප්‍රඥප්තිය ආරම්භ කරන දින සිට මාස හයක කාලයක් සඳහා තවදුරටත් ක්‍රියාත්මකව තැබීමට හා පවත්වාගෙන යාමට අවසර ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මාස 6 ක කාලයක් ඉකුත්වීමට පෙර, එම උපවගන්තියේ සඳහන් අනාථ නිවාසය ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා ප්‍රඥප්තියේ 8 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කළ යුතු ය.

(3) මෙම වගන්තියේ (2) වන වගන්තිය ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් කර ඇති විට පළාත් කොමසාරිස්වයා විසින්, VI වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තාවකාලික ලියාපදිංචි සහතිකයක් ප්‍රදානය කරනු ඇති අතර, එය මාස හයක කාලයක් සඳහා වලංගු වනු ඇත. එම කාලය ඉක්මයාමට පෙර අදාළ අනාථ නිවාසය 4 සහ 8 වැනි වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කරුණු අනුගමනය කළ යුතු බවට, පළාත් කොමසාරිස්වරයා විසින් සුදුසු පරිදි නියම කරනු ලැබිය හැකි අතර, එම කාලසීමාව ඉකුත්වීමෙන් පසු මෙම ප්‍රඥප්තිය යටතේ අදාළ අනාථ නිවාසය ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ තීරණය කළ යුතු ය.

45. මේ පනතේ දෙමළ හා සිංහල භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## I වන උපලේඛනය

(4(ඇ)) වගන්තිය

### ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ අවම ප්‍රමිති

1. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් පොලිස් වාර්තා සහ ප්‍රසිද්ධ රජයේ නිලධාරීන්ගෙන් තුන්දෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතු ය.

2. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය උතුරු පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් ළමුන් සමග වැඩ කිරීමට අනුමැතිය ලබාගත යුතු ය.

3. ගැහැණු ළමයින් සඳහා වන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් බහුතරයක් කාන්තාවන් විය යුතු අතර, කාන්තා සාත්තු සේවිකාවන් ද පත් කළ යුතු ය.

4. වරදකරුවන් වුව ද, නොවුව ද කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වැඩිහිටි හෝ ළමා අපයෝජන අපරාධ නඩුවල චූදිතයන් නොවිය යුතු ය.

5. (i) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් අ.පො.ස (උ/පෙළ) විෂයයන් දෙකක් සමත් විය යුතු ය ; ළමා සංවර්ධන හා ළමා මනෝවිද්‍යාව පිළිබඳ පුහුණු වී තිබිය යුතු ය ; සහ ළමයින් බලා ගැනීම පිළිබඳ අවම වශයෙන් වසර 5ක අත්දැකීම් තිබිය යුතු ය ; සහ වයස අවුරුදු 30-60 දක්වා විය යුතු ය.

(ii) ළමුන් බලා ගන්නන් අ.පො.ස (සා/පෙළ) විෂයයන් 6ක් සමත්ව තිබිය යුතු අතර, ඉන් දෙකක් ගණිතය හා දෙමළ විෂය විය යුතු ය ; අවම වශයෙන් අවුරුදු 2ක පළපුරුද්ද සහ වයස අවුරුදු 25 හා 60 අතර විය යුතු ය.

(iii) යම් ස්වේච්ඡා සේවකයකු ගණිතය හා දෙමළ ඇතුළුව අ.පො.ස (සා/පෙළ) විෂයයන් 6ක් සමත්ව තිබිය යුතු අතර, ළමයින් රැක බලා ගැනීම සම්බන්ධයෙන් අවම වශයෙන් මාසයක පළපුරුද්දක් ඇති සහ වයස අවුරුදු 18 සහ 60 අතර තැනැත්තන් විය යුතු ය.

6. සෑම ළමයකුගේම ආගම, වයස, ස්ත්‍රී පුරුෂභාවය, හා මානසික තත්ත්වය සලකා බලා ඔවුන් ස්ථාපනය කළ යුතු යි.

7. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් විශේෂයෙන් රැක බලාගත යුතුයි.

8. (1) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පහත සඳහන් එක් වයස් කාණ්ඩයකට අයත් ළමුන්ට පමණක් සේවා සැපයිය යුතුයි.

(i) වයස අවුරුදු 6-10 දක්වා ; හෝ
(ii) වයස අවුරුදු 11-18 දක්වා.

(2) ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් සඳහා (i) වන වයස් කාණ්ඩය යටතේ ගැහැණු හා පිරිමි දෙවර්ගයේම ළමුන් ඇතුළත් කර ගත හැකි අතර (ii) වන වයස් කාණ්ඩය යටතේ ඇතුළත් කර ගන්නා ළමයි ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙන් වෙන්ව ඔවුන් ස්ථාපනය කළ යුතුයි.

9. ළමුන් සිටින සෑම ගොඩනැගිල්ලකට ප්‍රථමාධාර පෙට්ටියක් තිබිය යුතුයි.

10. පුස්තකාලයක් පවත්වාගත යුතු අතර සෑම ළමයකුගේම වයසට සරිලන පොත් එහි අඩංගු විය යුතුයි.

11. ළමුන් සඳහා විවේක කාලයේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට රූපවාහිනියක්, රේඩියෝ, වාද්‍ය භාණ්ඩ, පොත් යොදාගෙන කරන ක්‍රීඩා, චිත්‍ර ඇඳීමට කළමනා එහි තිබිය යුතුයි.

12. ශාරීරික හෝ මානසික ආබාධ ඇති ළමුන්ට විධිමත් පහසුකම් සැලැස්විය යුතුයි.

13. ළමුන්ට තම දෙමාපියන්, ඥාතීන්, සහ යහළුවන් හමුවීමට ළමා සංවර්ධන මධ්‍යස්ථානය විසින් තම පරිශ්‍රය තුළ පහසුකම් සැලැස්විය යුතුයි.

14. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සෑම ගොඩනැගිල්ලකටම පාහේ ක්‍රියාකාරී ගිනි නිවනයක් තිබිය යුතුයි.

15. ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වයස අවුරුදු 6 ට අඩු දරුවන් 5 දෙනෙකු සඳහා අවම වශයෙන් කාර්ය මණ්ඩලයේ 1 සාමාජිකයෙකුවත් සහ වයස අවුරුදු 6ට වැඩි දරුවන් 25 දෙනෙකු සඳහා අවම වශයෙන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 3 දෙනෙකුවත් සිටිය යුතුයි.

16. ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් පිට වූ පසු රැකියාවක නියුක්ත වීම සඳහා ළමුන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම හෝ පුහුණු කිරීම කළ යුතුයි.

17. සෑම ළමයකුටම වෛද්‍යවරයෙකු වෙත ලියාපදිංචි වීමට අවස්ථාව සලසා දිය යුතුයි.

18. ළමා සංවර්ධන මධ්‍යස්ථානය අධ්‍යාපන ආයතන අසළ පිහිටා තිබිය යුතුයි.

19. ළමා සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිලි ළමුන්ට සුදුසු පරිදි සකස්කර තිබිය යුතුයි.

20. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පරිශ්‍ර ගොඩනැගිලි, නිදන කාමර, වැසිකිලි හා නාන කාමර, වාඩි වීමට ආසන පැනවූ කොටස්, පාඩම් කිරීමට ස්ථාන, එළිමහන් ක්‍රීඩා අවකාශ, ගෙවතු, කෑම කාමර පහසුකම් පැවතිය යුතුයි. ආබාධිත ළමුන්ට මෙම කොටස් සඳහා ප්‍රවේශ පහසුකම් පැවතිය යුතුයි.

21. සෑම ළමයෙකුටම ගෘහස්ථ ඉඩක් (වර්ග අඩි 36ක) වෙන්කර පැවතිය යුතු අතර ඔහු හෝ ඇය සඳහා වෙන් වූ ඇඳක් තිබිය යුතුයි. සෑම ඇඳකටම මදුරු දැලක් ද සෑම ළමයෙකුටම වෙන් වූ අගුළු සහිත කබඩ් එකක් ද තිබිය යුතුයි. කාමර සඳහා ප්‍රමාණවත් ආලෝකයක් හා වාතාශ්‍රයක් පැවතිය යුතුයි.

22. සෑම ළමයි 8 දෙනෙකුටම එක් වැසිකිළියක් හා නාන කාමරයක් බැගින් වැසිකිලි හා නාන කාමර පහසුකම් ළමුන්ගේ කාමරවලට යාබදව පැවතිය යුතුයි.

23. අඛණ්ඩ ජල සැපයුමක් පැවතීම සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජල ටැංකි පැවතිය යුතුයි.

24. පිරිමි හා ගැහැණු ළමුන්ට වෙන් වෙන්ව වැසිකිළි හා නාන කාමර පහසුකම් පැවතිය යුතුයි.

25. ළමුන්ට පාඩම් වැඩ අඛණ්ඩව කරගෙන යාම සඳහා ප්‍රමාණවත් පුටු හා මේස සංඛ්‍යාවක් පැවතිය යුතුයි.

26. පාඩම් කිරීමට වෙන් වූ ස්ථානය පොදු අංශවලින් වෙන්කර පැවතිය යුතුයි.

27. ළමුන් සඳහා ප්‍රමාණවත් තරම් පිඟන්, කෝප්ප, හා හැඳි සංඛ්‍යාවක් තිබිය යුතුයි.

28. ළමා සංවර්ධන මධ්‍යස්ථානය වටා උස තාප්පයක් තිබිය යුතු අතර දවසේ පැය 24 පුරා මුරකරුවකු සේවයේ යොදවා සිටිය යුතුයි.

29. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළමුන් සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රවාහන පහසුකම් තිබිය යුතුයි.

30. විදුලිය නොමැති අවස්ථාවක දී භාවිත කිරීමට විදුලි පන්දම් සහ ආලෝකය ලබා දීමේ පහසුකම් තිබිය යුතුයි.

31. ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පැමිණිලි සඳහා පෙට්ටියක් පැවතිය යුතු අතර නිර්නාමිකව පැමිණිලි කිරීමට අවස්ථාව සැලසිය යුතුයි.

## II වන උපලේඛනය

(6(I) වගන්තිය)

### තාවකාලික අනුමතය ලබාගැනීම සඳහා අයදුම්පත

1. අනුමතය ඉල්ලා සිටින ස්වෙච්ඡා සංවිධානයේ හෝ ආයතනයේ නම :-
2. ස්වෙච්ඡා සංවිධානයක් ලෙස ලියාපදිංචි වීමේ දී දෙන ලද අංකය :-
3. ළමා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ඇතුළත් කරගැනීමට යෝජිත ළමුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය හා අවම වයස :-
4. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නඩත්තුව සඳහා අරමුදල් සපයාගැනීමට දැනට පවත්නා මූලාශ්‍ර :-
5. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමේ කාර්යය සඳහා දැනට පවත්නා සම්පූර්ණ අරමුදල් ප්‍රමාණය :-
6. යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් හා ලිපින :-
7. අනුමතය ඉල්ලා සිටින අයදුම්කරු මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ සඳහන් අවම ප්‍රමිති සපුරා ඇත්ද යන්න :-

පිහිටුවීමට යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ඔප්පුව සහ යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නඩත්තුව සඳහා ඉදි කිරීමට නියමිත ගොඩනැගිල්ලේ හෝ ගොඩනැගිලිවල සැලැස්ම මෙයට අමුණා ඇත.

යෝජිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ,
කළමනාකරණ මණ්ඩලයේ,
කළමනාකරුගේ අත්සන.

දිනය : මුද්‍රාව

## III වන උපලේඛනය

(6(3) (ආ) වගන්තිය)

### තාවකාලික ලියාපදිංචි සහතිකය

උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස් වන .............................................................................. මවිසින්, උතුරු පළාතේ 2016 අංක 04 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 6(3)(ආ) වගන්තිය යටතේ, ................................................................. යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් මෙයින් නිකුත් කරනු ලැබේ.

.................................................................... වන මෙදින නිකුත් කරනු ලැබිණ.

උතුරු පළාතේ පරිවාස සහ
ළමාරක්ෂක සේවා
කොමසාරිස්ගේ අත්සන.

දිනය : මුද්‍රාව

IV වන උපලේඛනය

(6(2) (ආ) වගන්තිය)

**ලියාපදිංචි සහතිකය**

උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස් වන ............................................................................... මා, ......................................................................................... යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානය, උතුරු පළාතේ 2016 අංක 04 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 8(2) (අ) වගන්තිය යටතේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස මවිසින් ලියාපදිංචි කරනු ලබන බව මෙයින් සහතික කරමි.

..................................................................... වන මෙදින නිකුත් කරනු ලැබිණ.

උතුරු පළාතේ
පරිවාස සහ ළමාරක්ෂක සේවා
කොමසාරිස්ගේ අත්සන

දිනය : මුද්‍රාව

V වන උපලේඛනය

(40 (1) වගන්තිය)

40 (1) වගන්තිය යටතේ තොරතුරු වාර්තාව

ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම සහ පිහිටා ඇති ස්ථානය :-

මෙහි සඳහන් දින සිට ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන් සංඛ්‍යාව,
ඔවුන්ගේ වයස සහ ස්ත්‍රී පුරුෂභාවය :-

මෙහි සඳහන් දින සිට පූර්වගාමී මාස තුනක කාලයක් තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ තදබල ලෙස අසනීප වූ ළමුන් සංඛ්‍යාව සහ එක් එක් ළමයාගේ අසනීපයේ ස්වභාවය :-

ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික ළමුන්ගේ ආහාර වේලක ස්වභාවය හා ප්‍රමාණය සහ එක් එක් ළමයාට දිනකට ලබා දෙන ආහාර වේල් ගණන :-

මෙහි සඳහන් දින සිට පූර්වගාමී මාස තුනක කාලයක් තුළ ළමා සංවර්ධන මධ්‍යස්ථානය හැර ගිය ළමුන් ඇත්නම් එම සංඛ්‍යාව සහ හැර යාමට හේතු :-

ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ
කළමනාකරණ මණ්ඩලයේ,
කළමනාකරුගේ අත්සන

දිනය : මුද්‍රාව

VI වන උපලේඛනය

(41(3) වගන්තිය)

තාවකාලික ලියාපදිංචි සහතිකය

උතුරු පළාතේ පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස් වන ............................................................................. මා උතුරු පළාතේ 2016 අංක 04 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියේ 41(3) වගන්තිය යටතේ, අනත්දරු නිවාස ආඥා පනතේ (142 වන අධිකාරිය) විධිවිධාන ප්‍රකාර පිහිටුවන ලද හා ................................................................................................ යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන අනත්දරු නිවාසයක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් මෙයින් නිකුත් කරනු ලබන අතර එය වර්ෂ 20..........................................මස .................. වන මෙදින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

උතුරු පළාතේ
පරිවාස සහ ළමාරක්ෂක සේවා
කොමසාරිස්ගේ අත්සන

දිනය : මුද්‍රාව

12 - 509